0186

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) හදීස් නිර්දේශිත නීති මූලාශ්‍රයක්ය යන්න තහවුරු කෙරෙන අල්-කුර්ආනයේ දැක්වෙන සාධක **දෙකක්** සඳහන් කරන්න.
   (ii) හදීසයක් ප්‍රතික්ෂේප කිරීම පදනම් වන කරුණු **දෙකක්** සඳහන් කරන්න.
   (iii) ගොතන ලද හදීස් බිහිවීමට හේතු **හතරක්** සඳහන් කරන්න.
   (iv) මුතවාතිර්, ආහාද් යන හදීස් වර්ග ගැන කෙටියෙන් විස්තර කරන්න.
   (v) හදීස් ක්ෂේත්‍රයේ වර්ධනයට ඉමාම් බුහාරි (රහ්) තුමා ලබාදුන් දායකත්වය විස්තර කරන්න.
   (ලකුණු 04 × 5 = 20 යි)

2. (i) කිලාෆතුර්රාෂිදාහි පළමු කලීෆාවරුන් දෙදෙනා තෝරන ලද ක්‍රම සඳහන් කරන්න.
   (ii) කලීෆා අබූ බක්කර් (රලි) තුමා කිලාෆතය භාර ගැනීමෙන් පසුව කළ දේශනය කෙටියෙන් සඳහන් කරන්න.
   (iii) කලීෆා උමර් (රලි) තුමාගේ පාලන සමයේ රාජධානිය ව්‍යාප්ත වූ ආකාරය ගැන පැහැදිලි කරන්න.
   (iv) උමයියා කලීෆාවරු රටේ පරිපාලනයේ ඇති කළ වෙනස්කම් **හතරක්** විස්තර කරන්න.
   (v) කලීෆා අබ්දුල් මලික්, උමයියා කිලාෆතය ස්ථිර කිරීමට ලබා දුන් දායකත්වය අගය කරන්න.
   (ලකුණු 04 × 5 = 20 යි)

3. (i) මුස්ලිම්වරුන් සංගීත ක්ෂේත්‍රයට හඳුන්වාදුන් සංගීත භාණ්ඩ **හතරක්** සඳහන් කරන්න.
   (ii) ඉස්ලාම් හි සංගීතය අනුමත කර තිබේ ද යන්න විස්තර කරන්න.
   (iii) උමයියා අබ්බාසි සමයන්හි නිර්මාණය කරන ලද බලකොටු **දෙකක්** පිළිබඳව විස්තර කරන්න.
   (iv) අක්ෂර කලාව කෙරෙහි මුස්ලිම්වරුන් උනන්දුව දැක්වීමට හේතු වූ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න.
   (v) අරාබි අක්ෂර කලාවෙහි අර්-රිකා හා අන්-නස්හු ගැන කෙටියෙන් විස්තර කරන්න.
   (ලකුණු 04 × 5 = 20 යි)

## II කොටස

4. (i) වෛද්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට මුස්ලිම් විද්වතුන් දෙදෙනෙක් සිදු කළ දායකත්වය විස්තර කරන්න.
   (ii) කලීෆා මැමූන් සමයේ තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය පැහැදිලි කරන්න.
   (ලකුණු 10 × 2 = 20 යි)

5. (i) ඉස්ලාම් කිලාෆතයේ ගෝත්‍රික විසංවාද ඇති කළ බලපෑම් විමසන්න.
   (ii) කුරුස යුද්ධ, ඉස්ලාම් ලෝකයේ ඇති කළ බලපෑම් විස්තර කරන්න.
   (ලකුණු 10 × 2 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

6. (i) මුඃතසිලා සහ අෂ්-අරියියා චින්තන අතර දක්නට ඇති වෙනස්කම් සංසන්දනය කරන්න.
(ii) ෂිආවරුන්ගේ උප කොටස් වූ නුසෛරිවරුන් හා බාතිනීවරුන් පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු $10 \times 2 = 20$ යි)

7. (i) ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වා දුන් ආකාරය මූලාශ්‍ර සහිතව විස්තර කරන්න.
(ii) ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය හා සම්බන්ධ කිරීමට මුස්ලිම්වරුන් දුන් දායකත්වය විස්තර කරන්න.

(ලකුණු $10 \times 2 = 20$ යි)

8. (i) දේව නීතිය හා මිනිසාගේ නීතිය අතර වෙනස්කම් විස්තර කරන්න.
(ii) පවුල් නිර්මාණයේ දී පුරුෂ හා ස්ත්‍රිය යන දෙදෙනාගේ අයිතිවාසිකම් හා යුතුකම් ගැන පැහැදිලි කරන්න.

(ලකුණු $10 \times 2 = 20$ යි)

* * *